
දාවිත් සහ ගොලියත්ගේ කතාව

# දාවිත් සහ ගොලියත්ගේ කතාව



ඊශ්‍රායෙලයේ රජතුමා වුනේ සාවුල් කියලා මනුස්සයෙක්. සාවුල් රජතුමා ඊශ්‍රායෙල් හමුදාව යූදා වල තියෙන නිම්නයකට අරන් ගියා. සාවුල් රජතුමායි එයාගේ හමුදාවයි පිලිස්තිවරුන්ගේ හමුදාවට විරුද්ධව සටන් කරන්න ලෑස්තිවෙනගමන් හිටියා.

පිලිස්ති වල ගොලියත් කියලා මනුස්සයෙක් ජීවත් වුනා. ගොලියත් ගොඩක් ලොකු මනුස්සයෙක්. ගොලියත් මීටර් තුනක් උස වුනා, එයා ගොඩක් ලොකු හෙල්ලයක් අරගෙන ගියා. ගොලියත්ගේ හෙල්ලයේ කෙළවර කිලෝ හතක් බර වුණා.


ගොලියත් පිලිස්තිවරුන්ගේ හමුදාවේ සෙබලෙක් වුණා. හැමදාම ගොලියත් ඊශ්‍රායෙල් හමුදාවට ආවා. ඊටපස්සෙ එහෙ සෙබළුන්ට කෑගැහුවා;

> “මාත් එක්ක සටන් කරන කෙනෙක් තෝරාගන්න. ඒ මනුස්සයා මාව මැරුවොත්, අපි ඔයාලගේ වහලුන් වෙනවා. ඒත් මම ඒ මනුස්සයා මැරුවොත්,ඔයාලා අපේ වහලුන් වේවි.”



සාවුල් රජුතුමායි එයාගේ සෙබළුයි ගොලියත්ගේ වචන ඇහුන හැමවෙලාවෙම බය වුණා.

දාවිත් කියලා තරුණ ළමයෙක් ඊශ්‍රායෙලයේ ජීවත් වුණා. දාවිත්ගේ සහෝදරයන් ඊශ්‍රායෙලයේ හමුදාවේ සෙබළුන්. දවසක් දාවිත්ට එයාගේ සහෝදරයන්ට කෑම ටිකක් අරගෙන යන්න ඕනවුණා. ඒ නිසා එයා ඊශ්‍රායෙල් හමුදාව ඉන්න නිම්නයට ගියා.



දාවිත් නිම්නයට ඇවිත් ඉන්නකොට, එකිනෙකා එක්ක සටන් කරන්න ලෑස්තිවෙන හමුදා දෙකක් එයා දැක්කා. ඉතින් එයා ඉක්මනින් එයාගේ සහෝදරයන් ලගට දුවගෙන ගියා. ඊටපස්සේ දාවිත් එයාගේ සහෝදරයන්ට ආචාර කළා.

දාවිත් එයාගේ සහෝදරයන්ට කතාකරනගමන් ඉන්නකොට ගොලියත් ඊශ්‍රායෙල් හමුදාවට කෑ ගහන්න පටන්ගත්තා. ගොලියත්ගේ වචන ඇහුව සෙබළුන් ගොඩක් බයෙන් එයාගෙන් පැනලා ගියා.


දාවිත් සෙබළුන්ගෙන් ඇහුවා,

"ගොලියත්ව මරන කෙනාට රජතුමා මොනවද දෙන්නේ?"

සෙබළු උත්තර දුන්නා,

"මනුස්සයෙක් ගොලියත්ව මරනවා නම්, රජතුමා එයාට ගොඩක් සල්ලි දෙනවා. රජතුමා එයාගෙ දුවත් ඒ මනුස්සයාට දෙනවා එතකොට ඒ මනුස්සයාට එයාව කසාද බඳින්න පුලුවන්."

ඊට පස්සෙ දාවිත් සාවුල් රජතුමා ලඟට ගියා. ඒ වගේම දාවිත් සාවුල් රජුතුමාට කිව්වා,



"මම ගොලියත් එක්ක සටන් කරන්නම්" කියලා.

ඒත් සාවුල් රජතුමා මෙහෙම කිව්වා,


"ඔයා පොඩි පිරිමි ළමයෙක් නිසා ඔයාට ගොලියත් එක්ක සටන් කරන්න බෑ."

ඊටපස්සෙ දාවිත් මෙහෙම කිව්වා,

"ගොලියත් පරද්දන්න දෙවියන් වහන්සේ මට උදව් කරයි."

ඉතින් සාවුල් රජතුමා කිව්වා,


“හරි, යන්න ගොලියත් එක්ක සටන් කරන්න.”



දාවිත් ඇළක් ළඟට ගියා. ඊටපස්සෙ දාවිත් සිනිඳු ගල් පහක් තෝරාගත්තා. ඊට පස්සේ ඒ ගල් එයාගේ බෑග් එකට දාගත්තා.

ඒ වගේම දාවිත් ගොලියත් දිහාට ඇවිදගෙන යන්න පටන්ගත්තා. ගොලියත් දාවිත් තමන් දිහාට ඇවිදගෙන එනවා දැක්කා. ගොලියත් දැක්කා දාවිත් පොඩි පිරිමි ළමයෙක් කියලා. ඉතින් ගොලියත් දාවිත්ට ශාප කරන්න පටන් ගත්තා.


දාවිත් කිව්වා



“අද ඊශ්‍රායෙල්වල දෙවියෝ උඹව මරන්න මට උදව් කරයි. එතකොට පොළොවේ ජීවත් වෙන හැම මිනිසෙක්ම දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් වල ඉන්නා බව දැනගනීවී.”

ඊටපස්සෙ ගොලියත් දාවිත් එක්ක සටන් කරන්න එයාගේ දිහාට ඇවිදගෙන ගියා.


ඉතින් දාවිත් ඉක්මනින්ම එක ගලක් තමන්ගේ ගල්පටියට දාගත්තා. ඒ වගේම දාවිත් ගොලියත්ගේ දිහාට දුවගෙන ගියා.



ඊටපස්සෙ දාවිත් ගල ගොලියත් දිහාට එල්ල කලා. ඉතින් ගල ගොලියත්ගේ නළලේ වැදුණා. ගල ඉක්මනින්ම ගොලියත්ව මරලා දැම්මා. ඉතින් ගොලියත් බිමට වැටුනා. ඊටපස්සේ දාවිත් ගොලියත් දිහාට දුවගෙන ගියා. ඒ වගේම දාවිත් ගොලියත්ගේ මිනිය උඩ හිටගත්තා.

ගොලියත් මැරුණ බව දැක්ක  පිලිස්තිවරු ඊශ්‍රායෙල් සෙබළුන්ගෙන් පැනලා දිව්වා.  ඉතින් ඊශ්‍රායෙල් සෙබළුන් පිලිස්තිවරුන් පස්සේ පන්නගෙන ගියා.  ඒ වගේම ඊශ්‍රායෙල් සෙබළු පිලිස්තිවරුන්ගෙන් ගොඩක් දෙනෙක් මරලා දැම්මා.

ඊටපස්සෙ සාවුල් දාවිත් ගොලියත්ව මරලා දැම්ම නිසා එයාට තෑගි දුන්නා.



*පරිවර්තනය අයේෂා දහනායක සහ කස්ටින් බේලි විසිනි*

*Images used with the permission of FreeBibleimages.org*